රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 08/92

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1992 පෙබරවාරි මස 19 වෙනි දින.

**සියලුම:** අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්රුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන් සහ
රාජ්‍ය සංස්ථාවල, රජයට අයත් ව්‍යාපාරික ආයතනවල සහ
සම්පූර්ණයෙන්ම රජයට අයත් සමාගම්වල
සභාපති/ නිසි බලධාරීන් වෙත.

**ආදේශක සේවකයින්ට ස්ථිර පත්වීම් ලබාදීම.**

ඉහත කරුණ පිළිබඳව 1991 අගෝස්තු මස 14 වැනි දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 36/91 ට වැඩිමනත් වශයෙනි.

02. 1989.05.31 වැනි දිනට පෙර සේවයට බඳවා ගනු ලැබූ හා මෙතෙක් අවිච්ඡින්නව දෛනික සේවයෙහි යොදවනු ලැබ සිටින ආදේශක සේවකයින් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇත්තම්, 1992 ජනවාරි 15 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ ස්ථිර පත්වීම් ලබාදීමට ක්‍රියා කළ යුතුය.

I. තනතුරට අදාල අනුමත බඳවා ගැනීමේ පරිපාටියෙහි නියමිත සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

II. දැනට පුරප්පාඩුව පවතින ස්ථිර තනතුරක අවිච්ඡින්නව රාජකාරි කර තිබිය යුතුය.

03. මෙම චක්‍රලේඛයේ විධිවිධාන මාණ්ඩලික ශ්‍රේණිවලට අදාල නොවන්නේ ය.

අ.කලේ/ ( එම්.එන්.ජුනයිඩ් )
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.